# ජනපති තවම...

ශිවන්ති ප්‍රනාන්දු

ශ්‍රී ලංකාවේ ආගමික සහජීවනය පිළිබඳ සාකච්ඡා කිරීමට වේලාවක් ලබාදෙන්නැයි හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගෙන් කළ ඉල්ලීමකට මෙතෙක් කිසිදු ප්‍රතිචාරයක් ලැබී නැත.

ඒ බව පවසන්නේ හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියයි.

හිටපු ජනාධිපතිනිය මේ බව පැවසුවේ දකුණු ආසියා ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය (South Asian Policy Research Institute) හෙවත් (SAPRI) නියෝජනය කරමින් ඊයේ (11දා) විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා සමග පැවැත්වූ සාකච්ඡාවකින් අනතුරුව මාධ්‍ය හමුවේ ප්‍රකාශයක් කරමිනි.

SAPRI විසින් ආගමික සංහිඳියාව පිළිබඳ කමිටුවක් ආරම්භ කර ඇති බවත් ඒ අනුව ශ්‍රී ලංකාවේ ආගමික සහජීවනය පිළිබඳ ජනාධිපතිවරයාගෙන් මෙන්ම රජයේ ඇමැතිවරුන් ගණනාවකගෙන්ම සාකච්ඡාවට වේලාව ඉල්ලා ඇති බවත් ඉදිරියේදී තමන් හමුවීමට ඇමැතිවරුන් කිහිපදෙනකු වේලාව ලබාදී ඇති බවත් කී කුමාරතුංග මහත්මිය අග්‍රාමාත්‍යවරයාගෙනුත් සාකච්ඡාවක් සඳහා වේලාවක් ලබා ගැනීමට තමන් කටයුතු කරන බවත් පැවැසුවාය.

චන්ද්‍රිකා - රනිල් හමුව වාර්තා කිරීමට මාධ්‍යවේදීන් විශාල පිරිසක් පැමිණ සිටීම නිසා ඇතිවූ තදබදය හමුවේ විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා 'දැන් ජනාධිපතිතුමියත් තල්ලු වෙනවා' යැයි ප්‍රකාශ කෙළේය. විපක්ෂ නායකවරයා මාධ්‍ය හමුවේදී වරින්වර චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය පිළිබඳ සඳහන් කෙළේ ජනාධිපතිතුමිය යන වචනය අවධාරණය කරමිනි.

ජනාධිපතිවරයාගෙන් වේලාවක් නොලද බව හිටපු ජනාධිපතිනිය ප්‍රකාශ කෙළේ මෙසේය.

'අපි රජයෙනුත් ඉල්ලලා තියෙනවා සාකච්ඡාවලට වේලාවන්. පළමුවෙන්ම ඉල්ලුවේ ජනාධිපතිතුමාගෙන්. තාම පිළිතුරක්වත් ලැබිලා නැහැ. රජයේ ඇමැතිවරු ගණනාවකිනුත් ඉල්ලුවා. අමාත්‍යවරු දෙන්නෙක් තුන්දෙනෙක් අපිව මුණගැහෙන්න දැන් වෙලාව දීලා තියෙන්නෙ. ඉදිරියේදී අපි මේ ගැන ජනතාවත් දැනුම්වත් කරනවා. මෙයින් ඇතිවන භයානකත්වය සහ සියලු ජාතීන් ආගම්වලට අයත් අය එකතුවීමෙන් රටට ඇතිකරගත හැකි දියුණුව හා සංවර්ධනය සම්බන්ධයෙන් සාකච්ඡා කෙළේ. දේශපාලන කාරණා ගැන කොහෙත්ම සාකච්ඡා කෙළේ නැහැ.